# ක්‍රියාකාරකම් පත්‍රිකාව 5

## ලෝහ වලින් භාණ්ඩ නිෂ්පාදනය

**ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ලෝහමය නිපැයුමක් නිර්මාණය කිරීම සඳහා ලෝහ කොටසක් තෝරා ගැනීමේදී වඩාත් සැලකිලිමත් විය යුතු කාරණයක් ලෙස සඳහන් කල හැක්කේ

a) ලෝහයේ හෝ තහඩු වල ඝනකම
b) ලෝහ කොටසේ දිග සහ පළල
c) දළ සැලැස්මේ දී ඇති තොරතුරු වලට අදාල ප්‍රමාණයන්ය
d) ලෝහ කොටස් වල වර්ණවත් භාවය

**2. ඝනකම 0.3mm වූ ගැල්වනයින් තහඩුවක් භාවිතා කර සරල නිර්මාණයක් කිරීම සඳහා කොටස් වෙන් කර ගැනීමට ආවුද උපකරණ කිහිපයක් තැන්පත් කර තිබුණි. මේ කාර්යය සඳහා ඔබ තෝරා ගනු ලබන සුදුසුම උපකරණය හෝ ආවුදය කුමක්ද?**

a) ලෝහ කියත
b) උදු තල තහඩු කතුර
c) කපන කටුව පැතලි
d) ස්කෝච් තහඩු කතුර

**3. ලෝහ කම්බියක් 0.6mm ඝනකමින් යුක්තය. මෙයින් දිග 30cm ප්‍රමාණයේ කම්බි කොටස් කිහිපයක් කපා ගත යුතුව ඇත. මේ සඳහා සුදුසු උපකරණය වන්නේ**

a) පැතලි කපන කටුව
b) බංකු තහඩු කතුර
c) ලෝහ කියත
d) පොදු අත් අඬුව

**4. සිහින් ලෝහ තහඩුවක් සහ ඝනකම් ලෝහ තහඩුවක් ඔබ අතට ලබාදී එහි ඝනකම මැනීම සඳහා උපකරණ කිහිපයක් දුනිමි. එයින් තුනී තහඩුවේ ඝනකම මැනීමට සුදුසු උපකරණය කුමක්ද?**

a) පිටත කලපාසය
b) ව'නියර් කලපාසය
c) මයික්‍රෝමීටරය
d) වානේ කෝදුව

අන්තර්ගතය - ඩී.එම්.එස්.ඒ.දසනායක - කැ/මාව/පින්නවිල ම.ම.වි.,රඹුක්කන
සැකසුම - එච්.කේ.ආර්.ඉෂාරි- මාර/විලයාය ක.වි.,දම්පහල

5. තැලීමේ හා තෙරපීමේ උපකරණ ගණයට අයත් නොවන උපකරණයකි

a) දඬු අඬුව

b) අත් දඬු අඬුව

c) අතකොලුව

d) බංකු විදුම් යන්ත්‍රය

**6. කොටසේ වෙන්කර ගැනීම සඳහා ලෝහ කතුර භාවිතා කොට තහඩු කපා ගැනීමෙන් අනතුරුව හැඩ ගැන්වීම කළ යුතුය.ලෝහ තහඩුවක් හැඩ ගන්වා මට සිලුටු කිරීම සඳහා සුදුසු උපකරණයකි.**

a) රවුම් පීර

b) බට පොතු පීර

c) පැතලි පීර

d) ලෝහ කියත

**7. තහඩු කොටස් සම්බන්ධ කිරීමේදී මිටියම් ඇණ යොදා සම්බන්ධ කිරීමේ සාර්ථක ක්‍රමයකි.මෑත කාලයේදී ජනප්‍රිය මිටියම් ඇණ යෙදීමේ ක්‍රමයකි.**

a. මිටියම් ඇණ බෝල මිටියෙන් මිටියම් කිරීම.

b. පොප් මිටියම් යන්ත්‍රය භාවිතාකොට මිටියම් කිරිම.

c. ඇලුමිනියම් ලෝහයෙන් සකස්කල මිටියම් ඇණ යොදා මිටියම් කිරිම.

d. කම්බි ඇණයක් අවශ්‍ය ප්‍රමාණයට කපා මිටියම් කිරීම.

**8. කොටස් සම්බන්ධ කිරීමේ තවත් සුදුසු ක්‍රමයකි. පෑස්සීම මගින් සම්බන්ධ කිරීම.මෙහි දී තහඩු වලින් කරන ලද නිර්මාණයක් පෑස්සීම සඳහා සුදුසු පෑස්සුම් ක්‍රමය වන්නේ**

a) කම්මල් පෑස්සීම

b) දැඩි පෑස්සීම

c) මෘදු පෑස්සීම

d) විද්‍යුත් චාප හෝ ඔක්සි ඇසිටලින් වායු පෑස්සීම

අන්තර්ගතය - ඩී.එම්.එස්.ඒ.දසනායක - කෑ/මාව/පින්නවිල ම.ම.වි.,රඹුක්කන
සැකසුම - එච්.කේ.ආර්.ඉෂාරි- මාර/විලයාය ක.වි.,දම්පහල

**9.භාණ්ඩයක් නවහම් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ එම භාණ්ඩයේ**

a. ශක්තිමත්භාවය වැඩි කිරීම

b. කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම

c. භාණ්ඩයේ සෞන්දර්යාත්මක හා වාණිජමය අගය වැඩි කිරීම

d. දිරාපත්වීම වලක්වා ගැනීම

**10. ලෝහ තහඩු වලින් තනාගත් නිර්මාණයක් මතුපිට තුනතනාගම් ද්‍රව වශයෙන් ගෙන ආලේප කිරීම හෝ විද්‍යුත් ලෝහාලේපන ක්‍රමයට තැවරීම හඳුන්වනු ලබන්නේ**

a. ඔප දැමීම යනුවෙනි

b. ගැල්වනීකරණය යනුවෙනි

c. පින්තාරු කිරීම යනුවෙනි

d. මල ආරක්ෂණ යෙදීම යනුවෙනි

අන්තර්ගතය - ඩී.එම්.එස්.ඒ.දසනායක - කෑ/මාව/පින්නවිල ම.ම.වි.,රඹුක්කන
සැකසුම - එච්.කේ.ආර්.ඉෂාරි- මාර/විලයාය ක.වි.,දම්පහල